# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2287/34 – 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා – 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2022 අංක 108 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/3/2019/FR/202.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KOT/LND/ACQVI/01/81.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 ජුනි මස 03 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, කොටපොල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 241H කන්දිල්පාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිවැල්දොළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක අ.ග.පි. 125 හා 2020.09.07 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 86 – මානික්කවත්ත – ප්‍රමාණය: හෙක්. 11.4960**
උතුරට: සබරගමුව පළාත සහ කැබලි අංක 48; නැගෙනහිරට: කැබලි අංක 1 සහ 48; දකුණට: කැ.මැ.මු.පි. 23හි කැබලි අංක 73; බටහිරට: සබරගමුව පළාත සහ කැබලි අංක 48.

EOG 07 - 0045